මාධ්‍ය නිවේදන අංක **01**

# මැතිවරණ කොමිෂන් සභාව

**2020 වර්ෂයේ අප්‍රේල් හෝ මැයි මසයේදී පැවැත්වෙතැයි අපේක්ෂිත මහ මැතිවරණයේ දී භාවිත කරනුයේ 2019 ඡන්ද හිමි නාම ලේඛනය බැවින් එම මහ මැතිවරණයේ දී තැපෑලෙන් ඡන්දය දීමට අපේක්ෂිත ඡන්ද හිමියන් වෙත කෙරෙන දැනුම් දීමයි.**

- ඡන්ද විමසීම් රාජකාරීවල නියුක්ත කරවීමට නියමිත රාජ්‍ය සේවයේ නිලධරයකු හෝ සේවකයකුට
- ශ්‍රී ලංකා යුධ හමුදාවේ/ ශ්‍රී ලංකා නාවික හමුදාවේ/ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකුට
- පොලිස් දෙපාර්තමේන්තුවේ/ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවකයකුට
- ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/ තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ / ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ/ ............. ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකුට
- මැතිවරණය හා සම්බන්ධ කාර්ය සඳහා පත් කරනු ලැබූ/ පත්කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකුට
- මැතිවරණය හා සම්බන්ධ කාර්ය සඳහා පත් කරනු ලැබූ/ පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකුට

තමන්ට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී ඡන්දය දීමට නොහැකි/ නොහැකි වීමට ඉඩ ඇති බැවින්, තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කළ හැකි ය.

ඡන්ද විමසීම් සඳහා දින නියම කිරීමෙන් පසු තැපැල් ඡන්ද දායකයන්ට ස්වකීය තැපැල් ඡන්ද අයදුම් කිරීම අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඉටු කරගැනීම සඳහා 2019 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ මතු දැක්වෙන තොරතුරු කල් වේලා ඇතිව සූදානම් කර තබා ගන්නා මෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටී. එම තොරතුරු ඔබගේ ග්‍රාම නිලධාරී විමසීමෙන් හෝ පදිංචියට අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විමසීමෙන් හෝ මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මඟින් ලබා ගත හැකි ය.

ඡන්ද හිමි නාමලේඛනයට අදාළ වර්ෂය 2019

පරිපාලන දිස්ත්‍රික්කය :
ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය හා නම :
ඡන්ද කොට්ඨාසයේ අංකය :
ග්‍රාම නිලධාරී කොට්ඨාසය :
වීදියේ/ගමේ නම :
ඡන්ද හිමියාගේ සම්පූර්ණ නම :
තමන්ගේ නමට අයත් අනුක්‍රමික අංකය :
ජාතික හැඳුනුම්පත් අංකය :

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.02.26 දින